මේ සිස්ටම්එකට නම් ඔබම තමා

අජිත් පැරකුම් ජයසිංහ

මෙම ලේඛකයා කිසිකලෙක ඔබතුමාට ඡන්දයක් දී නැත. දැනටනම් දෙන්නට බලාපොරොත්තුවක්ද නැත. එයට හේතුව ඔබතුමාගේ ජාතිවාදයෙන් තෙම්පරාදු කරන ලද ධනවාදී හා ඒකාධිපතිවාදී දේශපාලන ප්‍රතිපත්ති අපට කිසිසේත්ම ගෝචර නොවීමයි.

සුළුතරයක් වන අප වැනි අයට ගැලපුණත්, නැතත්, ඔබේ ප්‍රතිපත්ති මේ රටේ බහුතරයක් වන දූෂිත ජනතාවට හොඳින් ගැලපේ. ඒ නිසා ඔබතුමා මේ රටේ ජනාධිපති ලෙස වැජඹෙනඑකට අප විරුද්ධවීමෙන් පලක් නැත.

ඔබතුමා මේ රටේ ජනතාවට ඉදිරියෙන් සිටිමින් ඔවුන්ට මග පෙන්වන නායකයකුට වඩා ඒ ජනතාව පස්සේ සිට උන් යන අත බලා, කෙවිටෙන් තළා රැළම ඒ පැත්තට දක්කමින් තමනුත් හයියෙන් හයියෙන් ඒ පැත්තට යන අපූරු ගොපල්ලෙකි.

ඔබතුමාට විරුද්ධ අය මොන මොනවා කීවත්, ඔබතුමා ලංකාවේ දැවැන්ත විප්ලවයක් සිදුකර තිබෙන බව පිළිගැනීමට සිදුවේ. මේ විප්ලවය කුමක්ද කියා හඳුනාගතයුතුය.

පසුගිය දිනවල ලංකාවේ සැරිසැරූ ලෝක බැංකු කළමනාකාර අධ්‍යක්ෂවරිය ඔබේ ආණ්ඩුවට ප්‍රශංසා කළාය. ඒ ලෝක බැංකුවට ලංකාව සම්බන්ධ කළ ප්ලග් ගැලෙව්වාය කී ඔබ රනිල් වික්‍රමසිංහටත් වඩා හොඳට ලෝක බැංකු වැඩසටහන හෙවත් ධනවාදය ලෝක බැංකුවේ ආධාරත් නැතිව ගිනි පොළියට ගත් ණයවලින් ඉදිරියට ගෙන යන නිසාය.

ලෝක බැංකුව අප්සෙට් වී සිටින බව පෙනෙන්නේ ඔබ විසින් නිර්මානය කර තිබෙන ආදායම් විෂමතාව නිසා මේ යන ගමන කඩකප්පල් වේද කියාය.

"It is very encouraging to see high growth in Sri Lanka" especially following the end of the war' However" the challenge for Sri Lanka is to sustain this impressive performance over the medium to long term and reduce inequality among provinces and income groups"") WB Managing Director Sri Mulyani Indrawati

එහෙත්, ඇත්තෙන්ම ලෝකබැංකුවට අප්සෙට් ඔබගේ ආර්ථික ක්‍රමවේදය තුළ පෞද්ගලික අංශයට ආයෝජන ප්‍රජාතන්ත්‍රවාදය අහිමිවීම නිසා වන්නට පුළුවන. එහෙත්, මෙහිදීද ඔබ අලුත්ම ක්‍රමයක් නිර්මානය කර තිබේ. මුදල් ඇත්නම්, ඔබේ පවුලේ කොටස ගෙවූවිට ආයෝජකයාට සියලු පහසුකම් හා රාජ්‍ය අනුග්‍රහය ලබාගන්නට පුළුවන.ආයෝජකයින්ට ඔය ලිබරල් කතා අදාළ නැත. ඒ නිසා ධනවාදයට ඔබ සමග පෑල්වීමේ කිසිම අපහසුවක් මටනම් නොපෙනේ.

එතරම් සල්ලි නැති සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකාරයෝනම් නන්නත්තාරය. ඔවුන්ට කරන්න තිබෙන්නේ ඔබේ භාණ්ඩාගාර බිල්පත්, ලංකා බැංකුවේ ණයකර වැනි ඒවායේ සිය මුදල් දමා පොළියෙන් සැනසීමයි. බිස්නස් ඔබට භාරයි.

> *හැමෝම හිතන්නෙ අපට හැම දෙයක්ම තියනව කියල. ඒත් ඇත්තටම ගත්තොත් අපට මුකුත් නෑ. අපට කියල ගෙයක් වාහනයක් නෑ. පොඩි කාලෙ ඉඳලම ඉඳල තියෙන්නෙ රජයේ දේපළවල. රජයේ වාහන තමයි පාවිච්චි කරන්නෙ - රෝහිත රාජපක්ෂ*

ඔබ කරන්නේ සියයට අටේ පොළියට ගත් ණය ගෙවන්නට සියයට 16ට ණය ගැනීමයි. (ලංකා බැංකුවේ ණයකර නිකුතුව බලන්න) හා, හා ඔහොම යං ඔහොම යං

ඔබේ හා ඔබේ දරුවන්ගේ සිහින අපට අපේ සිහින බවට පත්කරගන්නට සිදු වී තිබේ. ඒ සිහින සැබෑ වේද නැද්ද යන්න දන්නේ උඩ ඉන්නා දෙයියෝ පමණි. ඒ සිහින සැබෑ නොවුණොත් ඔබතුමාට හා පවුලේ අය කෙසේවෙතත් අපටනම් සිදුවන්නේ පොළවේ පස්කන්නයි. ඒ නිසා උතුමාණනි ඔය හම්බන්තොට පැත්තේ කරන දේවලින් මොකක් හෝ රටට වෙන්න ඔබතුමා දිගටම බලයේ ඉන්න.

රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව ලෝක බැංකුව සමග එක්ව ගෙනා "යළි පුබුදමු ශ්‍රී ලංකා" ධනේශ්වර වැඩසටහනේ තර්කය වුණේ දුප්පත්කම නැතිකිරීමයි. ඔබතුමානම් අනේ එහෙම කියන්නේ නැත. ඔබතුමාට අනුව අපේ රටේ දුප්පත්කමක් නැහැනේ. මේවා කරන්නේ මෙහේට කොරලා ඉවරවෙලා මාලදිවයිනට පාරවල් හදාදෙන්න, උගන්ඩාවට ටෙක්නිකල් කොලිපි හදාදෙන්නය.

ඔබේ බාලපුතා අභ්‍යවකාශ තරණය ගැන සිහින දකිමින් සිටින අතර අපට අපේ දරුවාට කන්නදීම, පාසලකට දමාගැනීම, රැකියාවක් සොයාගැනීම පවා සිහින බවට පත්වී තිබේ. කන්න, බොන්න නැතත් ආරක්ෂාවක්වත් තිබෙනවානම් කමක් නැත. එහෙමඑකකුත් නැත.

"හැමෝම හිතන්නෙ අපට හැම දෙයක්ම තියනව කියල. ඒත් ඇත්තටම ගත්තොත් අපට මුකුත් නෑ. අපට කියල ගෙයක් වාහනයක් නෑ. පොඩි කාලෙ ඉඳලම ඉඳල තියෙන්නෙ රජයේ දේපළවල. රජයේ වාහන තමයි පාවිච්චි කරන්නෙ,"යි කියන ඔබේ පුතාට මුළු රටම ඔහුගේ වෙද්දී අපේ දරුවන්ට අනාගතයක් සොයාගෙන අපට බෝට්ටුවලින් ඕස්ට්‍රෙලියා යන්නට සිදුවී තිබේ.

ඔබතුමන්ගේ මහේක්ෂ ආර්ථික ප්‍රතිපත්ති වන ධනවාදයේ, ධනවාදයේ හා ධනවාදයේ ආර්ථික වෘද්ධිය පහළට කාන්දුවීම අවමය. හේතුව කාන්දුවන දෙයක් තිබේනම් මග සිටින ඔබගේ බඩගිනිකාර, කෑදර ගෝලබාලයෝ එය උරාබෙන බැවිනි. ජනතාවට ඔබ දී තිබෙන බලාපොරොත්තුව වන්නේ එවැනි බඩගිනිකාර, කෑදර ගෝලබාලයකු වීමයි.අපේ වාමාංශික සහෝදරවරු අපි කරන්නේ මොනවාදැයි අසනමුත්, ඔබේ ක්‍රමයේ බඩගිනිකාර, කෑදර ගෝලබාලයකු නොවී මෙහෙම බ්ලොග් පඩංගුවක් ලියාගෙන අල්ලට සීනි රළක් දමාගෙන් කහට උගුරක් බී සැනසෙනඑකත් මාර අරගලයකි.

තමුන්නැහේ අර ඉස්සර කතා කළ ජාතිකවාදය දැන්නම් ක්‍රියාත්මක වන්නේ දෙමළ, මුස්ලිම් ජාතිකයන්ගේ කංකෙඳිරි ජාතික ඉල්ලීම් යටපත්කිරීමට පමණි. ධනවාදයේ ප්‍රවාහයට හසු වූ මේ සුළුතර ජාතිකවාදී ප්‍රවණතාද දැන් දුබල වී තිබේ. සුළුතර ජතිකවාදී ඉල්ලීම් දුබලවීමත් සමග දැන් ඔබතුමාගේ යටහත් සිංහල ජාතිකවාදීන්ටද යනඑනමං අහිමිවී තිබේ. ජාතිකවාදයට ඔබතුමාගේ ධනවාදයෙන් එල්ලවන ප්‍රහාරය දෙස මම නම් සුබවාදී අසකින් බලමි.

ඉදිරිගාමී දැක්මක් සංවර්ධනය කරගැනීමට අසමත් වූ ප්‍රභාකරන්ගේ දෙමළ ජාතිවාදය විසින් දෙමළ ජාතියට විනාශයේ සුරතාන්තය අතපත් කරදුන් සංදර්භයක් තුළ ජාතිකවාදයට ලංකාවේ තවදුරටත් කළහැකි කිසිවක් ඉතිරිවී නැතිබව සිංහල ජාතිවාදීන් පවා තේරුම් ගතයුතුව තිබේ.

කොහොමින් කොහොමහරි අපි අකැමැතිවුණාට දැන් ඔබතුමාගේ පවුල මේ රටේ පවතින අමුතු ක්‍රමයේ අත්තිවාරම වී හමාරය. මේ ක්‍රමය පවත්වාගෙන යන්නට නම්, මහින්ද, බැසිල්, ගෝටා ත්‍රිමූර්තිය අවශ්‍යය. රනිල්, සෝමවංශ, සරත් ෆොන්සේකා වැනි වෙනත් ත්‍රිමූර්තියකින් එය ප්‍රතිස්ථාපනය කරන්නට බැරිය.

මේ සිස්ටම්එකට නම් ඔබම තමාය.

w3lanka වෙබ් අඩවියෙනි

---

37 වන පිටෙන්

සෝම හිමියන්ගේ මරණය කේන්ද්‍රයේ දැක්වෙන ආකාරයටම සිදුව ඇති බව මේ කාරණා අනුව පෙනී යයි.
ඊළඟට මතුවන ප්‍රශ්නය සෝම හිමියන්ගේ ආයුෂ සම්බන්ධයෙනි. උන්වහන්සේ ගොදුරුවන්නේ අකල් මරණයකටය. සෝම හිමියන්ට උරුම මරණයේ ස්වාභාවය කේන්ද්‍රයේ සටහන්ව තිබුණාක් මෙන් උන්වහන්සේගේ ආයුෂ සම්බන්ධයෙනුත් කේන්ද්‍රයේ තොරතුරු දැක්විණිද?

ජන්මියෙකුගේ ආයු බලය විමසා බැලීමේදී ලග්නාධිපති විශේෂ අවධානයට ලක්කළ යුතුවේ. ලග්නාධිපති බලවත්වීම දීර්ඝායුෂ පෙන්වන අතර ලග්නාධිපති දුර්වලවීම ආයු බලය දුර්වලවීමට හේතුකාරක වේ. පූජ්‍ය ගංගොඩවිල සෝම හිමියන්ගේ ලග්න රාශිය කන්‍යාවයි. කන්‍යා රාශිය අයත්වන්නේ බුධටයි. එබැවින් ලග්නාධිපතියා බුධ වේ.

ලග්නාධිපතියා කවර තත්ත්වයකින් කවර රාශියක පතිතව සිටින්නේද, කවර දෘෂ්ඨි ලබන්නේද යන්න මත ලග්නාධිපතියාගේ බලය තීරණය වේ.

සෝම හිමියන්ගේ කේන්ද්‍රයේ ලග්නාධිපති බුධ තැන්පත්ව ඇත්තේ මාරක ස්ථානය වන 8වෙනි භාවයේය. නවාංශකයේ 2වෙනි භාවයේ වෘෂභ රාශියේ තැන්පත්ව ඇත. 8වැන්න සෘජුවම මරණය පිළිබඳ නිවේදනය කරන අතර 2වන භාවයද මරණය ගැන කියැවෙන ස්ථානයකි. ලග්නාධිපතියා මාරකස්ථානයේ තැන්පත්ව සිටීම අඩු ආයුෂ පෙන්වන පිහිටීමකි. ලග්නයේ මෙන්ම නවාංශකයේද සමාන තත්ත්වයක් පෙන්වන බැවින් එය වඩාත් තහවුරු වේ.

තවද ලග්න කේන්ද්‍රයේ මාරක ස්ථානයේ බුධ තැන්පත්ව ඇත්තේ නෛසර්ගික පාපියකු වන රාහු සහ කෘෂරයෙකු වන රවි සමගිනි. එලෙස පාප සංයෝගවීමෙන් ලග්නාධිපති තවදුරටත් දුර්වල කරනු ලැබ තිබේ. බලවත් රවි සමග බුධ සංයෝගවීම සුබ සංයෝගයක් වුවද මේ කේන්ද්‍රයේ එය අසුබව ඇත්තේ ග්‍රහ සංයෝගය දුෂ්ඨ ත්‍රිකයේ නරකම ස්ථානයේ පිහිටීම හේතුවෙනි. එබැවින් ලග්නාධිපතිගේ තැන්පත්වීම ආයුෂ සම්බන්ධයෙන් සුබ තත්ත්වයක් නොපෙන්වයි.

ලග්නාධිපති බුධට එල්ල වී ඇති ශනි, කුජ, කේතුගේ දෘෂ්ඨිද සුබ දෘෂ්ඨි නොවේ. මේ සියලු කරුණු මගින් ලග්නාධිපතියා නිවේදනය කරන්නේ ජන්මියාගේ ආයු බලය දුර්වල බවය. සෝම හිමියන් අපවත් වන්නේ වයස අවුරුදු පනස් පහේදීවීමෙන් ලග්නාධිපතියාගෙන් ආයුෂ සම්බන්දයෙන් කෙරෙන නිවේදනයේ නිවැරදිභාවය පෙන්වයි.

ලග්නාධිපතිගේ තත්ත්වය විමසා බැලීමෙන් පසු දැන් අපි ලග්නභාවයේ තත්ත්වය විමසා බලමු. සෝම හාමුදුරුවන්ගේ ලග්නභාවයේ කිසිම ග්‍රහයෙක් තැන්පත්ව නැත. ලග්නභාවයට කිවිගෙන් සහ ශනිගෙන් දෘෂ්ඨි ලැබී ඇත. ලග්නයේ බලවත්ව පුන්‍යස්ථානයේ තැන්පත්ව ඇති සිකුරුගේ දෘෂ්ඨියක් ලැබීම මගින් ලග්න භාවයට යම් බලයක් හිමිව ඇතත් ලග්නයට ශනිගේ දෘෂ්ඨියක් ලැබීම යහපත් නොවේ. ශනි එලෙස ලග්නයට දෘෂ්ඨි හෙළන්නේ මාරකස්ථානාධිපති කුජ සමග සංයෝගව සිටීමෙනි. එය ලග්නයට මාරකස්ථානාධිපතිගේ දෘෂ්ඨියක් වැටීමක් හා සමානව සැළකිය හැකිය. ලග්නාධිපති මෙන්ම ලග්නභාවයද ආයුෂ සම්බන්ධයෙන් යහපත් තත්ත්වයක් නොපෙන්වන බව මේ අනුව පැහැදිලිය.

ආයුෂ සම්බන්ධයෙන් විමසා බැලීමේදී වැදගත් වන අනෙක් ග්‍රහ තාරකාව වන්නේ රවිය. ඒ රවි ආත්මකාරකයා බැවිනි. රවි බලවත්ව යහපත් ස්ථානයක පිහිටීම දීර්ඝායුෂ පෙන්වයි. සෝම හිමියන්ගේ කේන්ද්‍රයේ රවි උච්ඡය. රවි මේෂයේ සිටියදී උපන්නහුට රවිගේ ගුණත් මේෂයේ ගුණත් එකසේ ලැබේ. එහෙත් රවි මාරක ස්ථානය වන 8 වැන්නේ තැන්පත්ව සිටීමෙන් ඒ සුබ පල හානිකරයි. එය සුබ පිහිටීමක් නොවේ. ජීවය දෙන්නා සිටින්නේ මාරකස්ථානයේය. එය දුක් කරදරවලට පමුණුවන මධ්‍යම වයසේදී පහසුවෙන් ලෙඩ රෝගවලට ගොදුරු කරවන පිහිටීමකි. ග්‍රහ දෘෂ්ඨි මගින්ද ආත්මකාරක රවි තවදුරටත් දුර්වල කරනු ලැබ තිබේ. රවිට චන්ද්‍රයාගෙන් සහ කේතුගෙන් ලැබෙන දෘෂ්ඨි අසුබය. මාරක ස්ථානයක් වන 11 අධිපති බැවින් කන්‍යා ලග්න හිමියාට සඳු තත්කාලීන පාපියෙකි. එවන් පාපී සඳු මාරකස්ථානාධිපති කුජගේ දෘෂ්ඨි ලැබ සිටීම තවත් නරකය. කේතු නෛසර්ගික පාපියෙකි. කෙසේ වුවද කේන්ද්‍රයක රවි බලවත්ව යහපත් තැනක පිහිටි විට ජන්මියාගේ ජීව බලය වර්ධනය කෙරේ. එසේ නොවන කළ ප්‍රතිඵලයද ඊට අනුරූපව යෙදේ. ඒ අනුව රවිගෙන්ද පෙන්වන්නේ ආයුෂ සම්බන්ධයෙන් යහපත් තත්ත්වයක් නොමැති බවය.



සෝම හිමියන් අපවත්වීමට වසර දහයක පමණ කාලයක සිට (වයස අවුරුදු 45 පමණ සිට) උන්වහන්සේට දියවැඩියාව සහ අධික රුධිර පීඩනය වැළඳී තිබුණු බව මරණ පරීක්ෂණයේදී හෙළිවීමෙන් රවිගේ පිහිටීම අනුව ජ්‍යෝතිෂ සිද්ධාන්තවල දැක්වෙන පලාපල කොතෙක් නිවැරදිදැයි යන්න තහවුරු වේ.

කේන්ද්‍රයක ආයුෂ ගැන දක්වන ප්‍රධානම භාව ස්ථානය 8වැන්නයි. මාරකස්ථානය ලෙස හැඳින්වෙන 8වැන්න අධිපති යහපත් ලෙස පිහිටීමත් 8වන භාවය යහපත් ලෙස පිහිටීමත් දීර්ඝායුෂ දක්වයි. එසේ නොවන කල ආයුෂ පිළිබඳ ගැටළුවක් ඇති බව දක්වයි. පූජ්‍ය ගංගොඩවිල සෝම

හිමියන්ගේ කේන්ද්‍රයේ මාරකස්ථානය අධිපති කුජ නීචව පාපියෙකු වන ශනි සමග 11වෙනි භාවයේ තැන්පත්ව සිටින්නේ ඉතා දුර්වල තත්ත්වයකිනි. එවන් කුජගේ දෘෂ්ඨිය දෙවෙනි භාවයේ සිටින සිතට අධිපති චන්ද්‍රයාට යොමුව තිබීමද ආයුෂ සම්බන්ධයෙන් සුබ නොවේ. මේ අනුව ලග්නාධිපතිගේ, ලග්නභාවයේ, රවිගේ සහ මාරකස්ථානය අධිපතිගේ තත්ත්ව විමසා බැලීමේදී පෙනී යන්නේ ආයුෂ සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් පවතින බව සහ ජන්මියාට දීර්ඝායුෂ හිමිවන විශේෂ බලයක් ජන්ම පත්‍රයෙන් නොපෙන්වන බවයි. ජන්මියා මන්දායුෂ්ක බවයි.

(ජන්මියෙකුගේ ආයුෂ සොයන ක්‍රම ගණනාවක් ජ්‍යෝතිෂයේ ඇතත් ලිපිය දීර්ඝ වන බැවින් ඒ පිළිබඳ මෙහිදී කරුණු සාකච්ඡා නොකෙරේ.) සෝම හිමියන්ගේ මරණය සම්බන්ධයෙන් බැඳුණු තවත් විශේෂ කාරණා ගණනාවක් තිබේ. උන්වහන්සේගේ ආදාහන උත්සවයට ලක්ෂ 40ක පමණ මහා ජනගහක් ගලා ආවේය. රාජ්‍ය අනුග්‍රහය ඇතිව මහත් ගෞරව බහුමානයනේ යුතුව එය පැවැත්වුණේය. හෙළිකොප්ටර් යානා යොදා අහසේ සිට මල් වැසි වැස්සුවේය. මෙවන් රාජකීය අවමංගල්‍යයක් උන්වහන්සේට උරුම වන බව මාරකස්ථානයේ බලවත්ව සිටින රවි නිවේදයන කරන කාරණයකි. විදෙස් රටක හුදකලාව අපවත්වූ වූ උන්වහන්සේගේ මරණය ඝාතනයක් බවට ගෙන ගිය මහා ප්‍රචාරය කොතෙක් බලවත්වීද යත් අධිකරණය වෛද්‍ය පරීක්ෂණයකින් තහවුරු කරනු ලැබූ කරුණුද නොසලකා අදටත් ඇතැමෙක් ඒ බව විශ්වාස කරති. මරණය සම්බන්ධයෙන් ඇතිවූ මේ ගුප්ත සහ අවිශ්වාසනීය තත්ත්වය මාරකස්ථානායේ පතිත රාහුගෙන් ප්‍රකාශිතය. රාහු සැළැකෙන්නේ හිස නැති ග්‍රහයෙක් ලෙසිනි. හිස නැති විට මොළයක්ද බුද්ධියක්ද නොමැත. හැසිරෙන්නේ හැඟීම්වල වහලුන් ලෙසිනි.

පුද්ගලයකුගේ කේන්ද්‍ර පරීක්ෂාවකින් මරණය ගැන කොතෙක් තොරතුරු අනාවරණය කරගත හැකිද යන්න මේ අනුව අපට පෙනෙයි.

ශ්‍රීලාල් සෙනෙවිරත්න